# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,136 - 2019 අගෝස්තු මස 09 වැනි සිකුරාදා - 2019.08.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 172 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 172 |


*සැ. යු.*- (i) එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2019 ජූලි මස 26 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2019 ජූලි මස 26 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 අගෝස්තු මස 30 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 අගෝස්තු මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


171- B 081549 - 353 (2019/08)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදානපත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

දකුණු පළාත් සභාවේ, ගාල්ල දිස්ත්‍රික්කයේ නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ටී. ජී. ඩී. නිලංගි ඩයස් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.08.27 වැනි දින ප්‍රදානය කර ඇති අංක 2/ගා/13/ප්‍ර/45395 හා එල්. එල්. 11580 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ගොඩාමුණ පදිංචි බුත්විට ලේකම්ලාගේ කරුණාවතී වෙත ප්‍රදාන කොට බලපිටිය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 1254 යටතේ 1997.06.04 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.08.26 දිනට පෙර මා වෙත දැනුම් දිය යුතු ය.

උපලේඛනය

ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෙන්තර වලල්ලාවිට (දකුණ) කෝරළේ 33 ඒ ගොඩාමුණ දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගොඩාමුණ නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, අ. ග. පි. 598 දරන කට්ටි කැබීමේ පිඹුරේ පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් රූඩ් 03, පර්චස් 23ක් විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම වල්විලකන්ද,

*උතුරට* : ගුරු පාර,
*නැගෙනහිරට* : දියෝනිස්ගේ බදු ඉඩම,
*දකුණට* : අර්නෝල්ඩ්ගේ ඉඩම,
*බටහිරට* : ප්‍රේමාගේ බදු ඉඩම.

ටී. ජී. ඩී. නිලංගි ඩයස්,
ප්‍රාදේශීය ලේකම්,
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්),
නියාගම.

2019 අප්‍රේල් මස 24 වැනි දින.

08-298

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :4/10/29270.
නියෝජ්‍ය/පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :
සීපීසී/එල්සී/එල්ඩී/4/1/28/106.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, දැඹව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දැඹව ගමේ අංක අ. ග. පි. 90 අනුරේඛනයේ අතිරේක කැබලි අංක 230/471 න් කොටසක් වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් රූඩ් 02 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වගා කටයුතු සඳහා රත්නබාහු මුදියන්සේලා ගෙදර සෙනවිරත්න මහතා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

*උතුරට* : බී. එම්. කලුබණ්ඩාගේ ඉඩම හා පාර,
*නැගෙනහිරට* : කේ. පී. කිරිහොදාගේ ඉඩම,
*දකුණට* : කේ. පී. දිසානායකගේ ඉඩම,
*බටහිරට* : මාගල් පොත්ත ගල රක්ෂිතය.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ) බදු කාලය.-* අවුරුදු තිහයි (30) (1995.06.15 දින සිට ඉදිරියට)

(ආ) *වාර්ෂික බදු මුදල*.- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ඉඩමේ 1995 වර්ෂයේ වර්තමාන නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ බදු මුදලින් 50% කට නොඅඩු විය යුතු ය.

දඩ මුදල. - ඉඩමේ දියුණු වටිනාකමින් 4% බැගින් වූ මුදල මෙන් තුන් ගුණයකි.

(*ඇ*) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

(*ඈ*) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වගා කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

(*ඉ*) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

(*ඊ*) සාද ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(*උ*) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියාකරනු ලැබේ.

(*ඌ*) අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදුදීම් කළ නොහැක.

(*එ*) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

පී. ඩී. අයි. එල්. විජේගුණවර්ධන,<br>
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්,<br>
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2019 අගෝස්තු මස 09 වැනි දින,<br>
කොළඹ 07, ශ්‍රෙගරි මාවතේ අංක 07 හි,<br>
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-299